**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2022**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.මිලියන 70.78 ක් වූ මෝටර් වාහන 09 ක්, රු. මිලියන 271.93 ක් වූ විද්‍යා උපකරණ සහ රු. මිලියන 42.59 ක් වූ කාර්යාල උපකරණ භාවිතා කරමින් පැවතියද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් නැවත තක්සේරුව ආරම්භ කර ඇති අතර 2023 පෙබරවාරි 28 වන විට නිමකරගත නොහැකි විය.එබැවින් 2023 අවසාන ගිණුම් වල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 වන ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භවන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්වයට ගෙන ආ පසුව වේ. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය මගින් ලබා දී තිබූ රු. මිලියන 56.47 ක් වූ වත්කමක් 2022 නොවැම්බර් 15 දින ස්ථාපිත කර තිබුණද, එකී වත්කම සඳහා 2022 ජනවාරි 01 දින සිටම ක්ෂය කිරීම හේතුවෙන් රු.මිලියන 9.90 ක් ක්ෂය වියදම වැඩියෙන් දැක්වුණ අතර වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වත්කම් 2021 වර්ෂයේ ලැබුණු බැවින් 2022.01.01 දින සිට ක්ෂය කිරීම ආරම්භ කරන ලදි. නමුත් අදාල වත්කම භාවිතයට ගැණුනේ 2022.11.15 දින සිට බැවින් එදින සිට ක්ෂය කර අවශ්‍යය ගැලපුම් 2023 වර්ෂයේදී සිදුකිරීම කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ සිට භාවිතයට ගනිමින් තිබූ රු.මිලියන 2.9 ක පරිගණක මෘදුකාංග (Computer Software) හා රු. මිලියන 1.40 ක විද්‍යාගාර උපකරණ සමාලෝචිත වර්ෂයේ වත්කම් ලෙස හඳුනාගෙන තිබූ අතර එම ප්‍රමාණයෙන්ම ක්ෂය කර තිබුණි.මෙය ඉකුත් වර්ෂයේ ගැලපීම් ලෙස දැක්වියයුතු වුවත් එලෙස සිදුකර නොතිබුණි. | මූල්‍ය තත්ව ප්‍රකාශයට මෙමගින් බලපෑමක් නොමැති බැවින් 2023 වර්ෂයේදී ගැලපීමට අවශ්‍ය නොවේ. | වත්කම් හා ඒවායේ ක්ෂය නිවැරදි කාලපරිච්ඡේදයට අනුව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන වායු විමෝචන භාරකාර අරමුදල විසින් 2020 නොවැම්බර් 20 දින ජාතික | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය ඒ සමඟ ලැබුණු ලොරි | වත්කම් හා ඒවායේ ක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත පවරා දී තිබූ රු. මිලියන 41.38 ක් වටිනා ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. තවද, ඊට අදාලව ක්ෂය ගැලපීම්ද සිදු කර නොතිබුණි. | රථයේ සවිකර තිබුණු අතර ලොරි රථයේ අයිතිය මේ වන විටත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත පවරා නොතිබීම හේතුවෙන් එම අධීක්ෂණ ඒකකයද 2022 වර්ෂයේ වත්කම් වලට නොගන්නා ලදි. 2023 වර්ෂයේදී එම ඒකකය වත්කම් වලට ඇතුලත් කර අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ වත්කම් අත්පත්කර ගැනීම් ලෙස පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙනවිත් තිබූ රු.මිලියන 2.26ක හඳුනා නොගත් ශේෂය හඳුනාගැනීමට කටයුතු නොකර රජයේ සහ අනෙකුත් ආයතනවල ප්‍රාග්ධන දායකත්ව ගිණුමට (Capital Contributed by Government & Other Entities) ගලපා තිබුණි. | මෙම ශේෂය මීට වසර 16 කට පෙර සිටම ගිණුම් ප්‍රකාශවල වත්කම් අත්පත් කර ගැනීමට ලැබුණු ප්‍රතිපාදනයක් ලෙස දක්වා තිබුණි.එම පදනමින් එම ශේෂය ප්‍රාග්ධන ගිණුමට ගලපන ලදි. මෙමගින් මූල්‍ය තත්ව ප්‍රකාශයට බලපෑමක් සිදුවී නොමැත. | හඳුනා නොගත් ශේෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කරන ලද රු. මිලියන 3.73ක හඳුනානොගත් ලැබීම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කිරීමකින් තොරව සංවිධානයේ විවිධ ආදායම් ලෙස දක්වා තිබුණි. | මෙම හඳුනා නොගත් ප්‍රේෂණ කිසිදු හඳුනාගැනීමේ කේතයක් නොමැතිව ආයතනයේ ජංගම ගිණුම වෙත බැරකල ප්‍රේෂණ වේ.මේ පිළිබඳ මහජන බැංකුවෙන් විමසීමක් සිදු කලද බැංකුවටද ඒවා හඳුනා ගැනීමට අපොහොසත් විය. අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු මඟින්ද,ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව මඟින්ද , මෙම හඳුනානොගත් ප්‍රේෂණ ආදායමට ගැනීමට උපදෙස් ලබාදෙන ලදී.ඒ අනුව එම ශේෂය ආදායමක් ලෙස ගිණුම් ගත කරන ලදි. | හඳුනානොගත් ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| **විෂයය** | **මූල්‍ය ප්‍රකාශ අනුව වටිනාකම රු.** | **අනුරූපි වාර්තා අනුව වටිනාකම රු.** | **වෙනස රු.** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| ස්ථායිකරණ ක්‍රමවේදය මගින් නායයෑමේ | රු. මිලියන 136.96 | රු.මිලියන 133.18 | රු.මිලියන 3.78 | 2023 මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි ගැලපීම් සිදුකිරීමට කටයුතු | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ගැලපීම් සිදුකිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය මගින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත ලැබිය යුතු ණය ශේෂය | කරනු ලැබේ. | කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු. මිලියන 18.68 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. මේ අතරින් රු. මිලියන 5.66 ක ශේෂය 2017 වර්ෂයට අයත් ශේෂ විය. | මෙම අත්තිකාරම් වලින් රු. 5,755,130.00 ක් ගෙවා ඇති කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අතහැර දමා ඇත.ඔහුගෙන් අයවිය යුතු අත්තිකාරම ඇපකරය ලබාදුන් රක්ෂණ සමාගමෙන් ලබා ගැනීමට අනුමැතිය ලැබී ඇත.එම මුදල ලැබුණු පසු අදාල ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ.<br>ඉතිරි අත්තිකාරම් මුදල වන රු.මි. 12,821,316.80 නව විද්‍යාගාරය ඉදිකිරිම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා ඇති අත්තිකාරම් මුදල් බිල්පත් වලින් අයකරගත් පසු අත්තිකාරම් ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා ඇති අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | වටිනාකම<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වේ 2000 ජනවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය හා 1994 ජුනි 04 දිනැති අංක 05 දරන | අමාත්‍ය මණ්ඩල හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව 2022 වර්ෂයේ ජනවාරි | රු.මිලියන 9.02 | පැමිණීමේ හා කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් 2013 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. මෙම දිරි දීමනා හේතුවෙන් ආයතනයේ සේවකයින්ගේ පැමිණීම හා කාර්ය සාධනය ඉහල මට්ටමක පවත්වා | අදාල අනුමැතීන් නොමැති ගෙවීම් නොකල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සිට අප්‍රේල් දක්වා සංවිධානය දිරිදීමනා ගෙවා තිබුණි. | | ගැනීමට හැකිවීම ලාභදායිත්වයද වසරින් වසර ඉහල යාම කැපී පෙනුනි.. කෙසේ වුවද, ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 දරණ 2022.04.26 දිනැති චක්‍රලේඛනයේ සීමා කිරීම් අනුව මෙම දීමනා ගෙවීම 2022 අප්‍රේල් මාසයෙන් පසුව තාවකාලිකව නවතා ඉදිරියේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් මේ පිළිබඳ අනුමැතිය ලබා ගෙන නැවත ගෙවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | |
| (ආ) | 2021 දෙසැම්බර් 28 දිනැති විගණන හා කළමණාකරන කමිටුවේ තීරණය | ව්‍යාපෘති සේවාවන් සඳහා දීමනා ගෙවීමේදී අන්තර් කළමනාකරණ කමිටු අනුමැතියක් ලබාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු බව විගණන හා කළමනාකරණ කමිටුව තීරණය කර තිබුණද, එසේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීමකින් තොරව රු. මිලියන 2ක් විශේෂ දීමනා ගිණුමකට හර කර ගෙවිය යුතු දීමනා ලෙස ගිණුමකට (Provision to Project Staff) බැර කර තිබුණි. | රු.මිලියන 2 | ඉංජිනේරු සහ භූ විද්‍යාඥ විශේෂිත කාර්යයන් සඳහා එම තනතුරුවලට දීමනාවක් කොන්ත්‍රාත්තුව පිරිනමන ආයතනය විසින් ගෙවනු ලබයි. මෙම කටයුතු සඳහා විශේෂතා පුද්ගලයින් විශාල වැටුපකට බාහිරින් බඳවා ගතහොත් ආයතනයට ලැබිය හැකි ලාභය ඉතා අවම වේ. තවද එම උපදේශන සේවාවන් නිසිපරිදි වගකීමෙන් හා සාමාන්‍ය රාජකාරී කාල සීමාවන් ඉක්මවා කටයුතු කිරීමට සිදුවීම, ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීම, විශේෂඥ දැනුමට සරිලන දීමනාවක් ගෙවීම වැනි කරුණු සැලකිල්ලට ගෙන වැටුපෙන් 1/3 ක් ගෙවීම පාදක කරගෙන දීමනා ගෙවීමට අන්තර් කළමනාකරණ කමිටුව විසින්ද ලබාදෙන ලද අනුමැතියට යටත්ව | අදාළ අනුමැතිය ලබාගෙන ගෙවීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | මෙම දීමනා ගෙවීමට වෙන් කිරීම් සිදුකිරීමට පියවර ගෙන ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 266,985,728ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 70,461,437ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.196,524,291ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අයහාර නොවන ආදායම රු.178,504,297 කින්ද, ප්‍රදාන මගින් ලද වත්කම්වල ක්ෂය රු.15,066,452 කින්ද, ව්‍යාපෘති කළමනාකරණ අංශයේ අතිරික්තය රු.19,140,828කින්ද,මානව ජනාවාස සැලසුම් සහ පර්යේෂණ අංශයේ අතිරික්තය රු.826,111කින්ද, භූ තාක්ෂණික සහ ඉංජිනේරු අංශයේ අතිරික්තය රු.14,730,579කින් ද, පරිසර අධ්‍යයන හා සේවා අංශයේ අතිරික්තය රු.1,385,038කින් ද, නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශයේ අතිරික්තය රු.9,829,025කින් ද වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

**2.2.1 පර්යේෂණ සංවිධානයේ එක් එක් අංශවල අතිරික්තය 2021 වර්ෂයට සාපේක්ෂව වර්ධනය වීම හෝ පිරිහීම**

භූ තාක්ෂණික හා ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරණ යන අංශවල අතිරික්තය 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී පිළිවෙලින් සියයට 27 ක හා 223 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මානව ජනාවාස සැලැසුම් සහ පර්යේෂණ, නාය යෑම් පර්යේෂණ සහ අවදානම් කළමණාකරණ, පරිසර අධ්‍යයන හා සේවා සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන අංශවල අතිරික්තය 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී පිළිවෙලින් සියයට 90, 60 ,91 සහ 182 පිරිහීමක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීමට ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021 ඔක්තෝම්බර් 12 දින අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව පිළියෙල කල පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 26 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණද, මෙතෙක් එම පනත පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙළ කිරීමට ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා 2021 ඔක්තෝම්බර් 12 දින අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව පිළියෙල කල පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 29 දින නීතිපති කෙටුම්පත් දෙපාර්තමේන්තු විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර අත්‍යවශ්‍ය කාර්යන් කිහිපයක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ විෂය පථයට ඇතුල් කිරීම අරමුණු කර නීතිපති දෙපාර්තමේන්තුව මඟින් සාකච්ඡා වටයක් 2023.03.02 දින පැවති අතර අවසන් නිර්දේශය කඩිනමින් ලබාදෙන බව දන්වා ඇත. | කඩිනමින් පනත සම්මත කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිහිටුවා වසර 30 ක් පමණ ගතවී ඇතත්, නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් සම්මත කර ගැනීමට සංවිධානයට නොහැකි වී තිබුණි. | | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නායයෑම් අනතුරු ඇඟවීම් නිකුත්කිරීම සඳහා විගණිත දිනය වූ 2022 සැප්තැම්බර් 15 දිනට අවදානම් සහිත දිස්ත්‍රික් 14 ක ස්වයංක්‍රීය වර්ෂාමාන 330 ක් ස්ථාපිත කර තිබුණු අතර ඉන් 72 ක් අක්‍රියව පැවතුණි. වර්ෂාමාන පද්ධති ප්‍රධාන කාර්යාලයෙන් නඩත්තු කරන බැවින් සේවක හිඟය හා අනෙකුත් වෙනත් කරුණු හේතුවෙන් නිසියාකාරව නඩත්තුව සිදුකර නොතිබුණි. ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිවල දත්ත සම්ප්‍රේෂණයට සිදුවන අවහිරතාවන්ද නිවැරදි පූර්ව නායයෑම් අනතුරු ඇඟවීමේ නිවේදන නිකුත් කිරීම කෙරෙහි බලපෑම් ඇති කරන බව නිරීක්ෂණය විය. | නායයෑම් අවදානම් දිස්ත්‍රික්කයන්හි ජල පෝෂක ප්‍රදේශ වල ස්ථාපිත කරන ලද ස්වයංක්‍රීය වර්ෂාමාන සම්බන්ධිත ජාලයක් මඟින් තත්කාලීන වර්ෂාපතන දත්ත ලබාගනු ලැබේ. දිස්ත්‍රික්ක 14 පුරා ස්ථාපනය කර ඇති වර්ෂාමාන වලින් යම් සංඛ්‍යාවක් ක්‍රියා විරහිත වුවද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන කාලගුණ පුරෝකථන සහ ආසන්නයේ ස්ථාපනය කර ඇති වර්ෂාමාන භාවිතා කර විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුව අනතුරු ඇඟවීම් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. | ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය නිසියාකාරව නඩත්තු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල වායු තත්ත්ව අධීක්ෂණ කටයුතු සඳහා අධි තාක්ෂණික ස්වයංක්‍රීය ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකයක් 2019 අප්‍රේල් 01 වන දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත භාර දී තිබුණි. ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය සමග WPLO -3426 දරන ලොරි රථය කොළඹ මහ නගර සභා පරිශ්‍රයේ 2020 වර්ෂයේ මාර්තු මස සිට | 2019 අප්‍රේල් 01 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකයේ අයිතිය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත 2020.11.20 දින සිට ලැබී ඇත. කෙසේ වෙතත් මෙම ඒකකය ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වාගෙන යාමට අවශ්‍යය ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොවූ හෙයින් ඒ වනවිටත් අප මෙම උපකරණ භාවිතා නොකර තැබීමෙන් ඒවාට සිදුවිය හැකි හානිය වලක්වා ගැනීමටත්, එම උපකරණ ප්‍රයෝජනවත් ලෙස භාවිතයට ගැනීමටත්, යන හේතූන් මත කොළඹ මහ නගර සභාවේ එකඟතාවය ඇතිව එම ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය කොළඹ මහ | කොළඹ මහ නගරසභා පරිශ්‍රය හා අනෙකුත් නාගරික ප්‍රදේශවලට සේවා සැපයීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නවත්වා තිබූ අතර එමගින් ලබා ගන්නා දත්ත කොළඹ මහ නගර සහා පරිශ්‍රයට පමණක් සීමා වී තිබුණි. අනෙකුත් නාගරික ප්‍රදේශවලට සේවා සපයා නොතිබුණි. | නගර සහා පරිශ්‍රයේ පූර්ණ ආරක්ෂාව සහිතව ස්ථානගත කර 2020 මාර්තු මස සිට දත්ත ලබාගැනීමට කටයුතු සකස් කරන ලදී. | |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්නපුර හා කළුතර දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීමට 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 143 ක් ලබා දී තිබූ අතර ඉන් රු. මිලියන 60.52 ක් උපයෝජනයකින් තොරව පැවතුණි. රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය නිම කර තිබුණ අතර කළුතර දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. | කළුතර දිස්ත්‍රික්කය සඳහා යෝජිත ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ විද්‍යාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය තුළ ආරම්භ කිරීමට නියමිතව පැවතියද, ඉඩම් කොටස ජා. ගො. ප. සංවිධානය වෙත පවරාදීමේ කටයුතු සිදුවී නොමැති බැවින් සැලසුම් කළ පරිදි එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. තවද, වසර දෙකක කාලයක් සඳහා රජයේ ගොඩනැගිලි ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවීමට රජය විසින් ගන්නාලද තීරණය අනුව ද, උක්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී.<br>එහෙත්, මේ වන විට අදාළ වාස්තු විද්‍යාත්මක සැලසුම් හා ව්‍යුහාත්මක සැලසුම් අවසන් කොට ඇත. | ප්‍රතිපාදනයන් අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කල යුතුය. |
| (ආ) | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ තාක්ෂණික දායකත්වයෙන් අධි අවදානම් කලාපවල ජීවත්වන පුද්ගලයන් සුරක්ෂිත ස්ථානවල පදිංචි කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 14 ක පවුල් 1000 ක් සඳහා නිවාස ඉදිකිරීමට පෙර වර්ෂවල ලද ප්‍රතිපාදන රු.මිලියන 28.07ක් උපයෝජනයකින් තොරව පැවතුණි. | ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් අධි අවදානම් කලාප වල ජීවත්වන පුද්ගලයින් සුරක්ෂිත ස්ථාන වල නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මත කරනු ලබන අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබාදීම සිදුකරනු ලබයි | ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් ඒ අයුරින් ඉටුකිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රසායනික අවදානම ක්‍රමාණුකූලව තක්සේරු කිරීමේ (Systematic Diagnostic Assessment of Chemical | මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ අවසාන රැස්වීමක් සංවිධානය කිරීමට බලාපොරොත්තු වන අතර එහිදී ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම කළමනාකරණය කිරීම සඳහා | ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් සැලසුම් කළ අයුරින් ඉටුකිරීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| Disaster Risk in Sri Lanka) ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 05ක් වෙන්කර තිබූ අතර වර්ෂය ආරම්භයේ රු. මිලියන 2.32ක පෙර වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිවීම්ද පැවතුණි. ව්‍යාපෘතියේ වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 4.25ක් වූ අතර රු. මිලියන 3.07ක් ඌණ උපයෝජිතව පැවතුණි. 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අවසන් කිරීමට නියමිතව තිබූණු මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂය අවසන්වන විටද නිමකර නොතිබුණි. | සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ට සකස් කරන ලද ක්‍රමවේදය, එහි මෙවලම් සහ දත්ත සමුදා රාමු හඳුන්වාදී ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීමෙන් සහ නැවත සමාලෝචනය කිරීමෙන් 2023 වසරේ ප්‍රථම අර්ධය තුලදී ව්‍යාපෘතිය අවසන් කිරීමට බලාපොරොත්තු වේ. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2022 වර්ෂය සඳහා රු. මිලියන 10ක ප්‍රතිපාදන ලැබී තිබුණි. සංවිධානය විසින් රු. මිලියන 3.77ක් ව්‍යාපෘති සඳහා උපයෝජනය කර තිබූ අතර රු. මිලියන 6.23ක මුදලක් ඌණ උපයෝජිතව පැවතුණි. එය ලද ප්‍රතිපාදනවලින් සියයට 62ක ප්‍රතිශතයක් විය.පසුගිය වර්ෂයේ නායයෑම් අවමකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 150ක ප්‍රතිපාදන ලැබී තිබුණද, රු. මිලියන 101.55ක් උපයෝජනය කිරීමකින් තොරව පැවතුණි. ඉහත ප්‍රතිපාදන භාවිතයෙන් 2022 අගෝස්තු 14 දිනෙන් නිම කිරීමට සැලසුම් කර තිබූ කොටහැරකන්ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණත් වර්ෂය නිමවන විටද එහි | නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා අක්මුදල් වශයෙන් රු.මිලියන 10 ක් පමණක් 2022.12.19 දින ලැබුණි.එම නිසා එම ව්‍යාපෘතිය සඳහා සැලසුම් කල කටයුතු ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි.<br>2021 වර්ෂයේ නායයෑම් අවදානම් ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු.මිලියන 150 ක මුදලම ගිවිසුම් වලට එළඹ ඇති අතර එයින් රු.මිලියන 140.67 ක් 2022.12.31 දිනය වන විට ගෙවා ඇත.තවද 2023.04.11 දිනය වන විට එහි ප්‍රගතිය රු.මිලියන 142.9 වේ.<br>වෙළෙඳපල පැවති ඉන්ධන හිඟය සහ අමුද්‍රව්‍ය හිඟය නිසා කොටහැරකන්ද ව්‍යාපෘතියේ වැඩ නියමිත දිනට නිම කිරීමට නොහැකි වූ අතර 2023.03.31 වන විට 80% ක පමණ ප්‍රගතියක් ලබා ඇත.2023.06.30 දිනය වන විට මෙම ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර ඇත. | ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් සැලසුම් කළ අයුරින් ඉටුකිරීමට පියවර ගත යුතුය. |

භෞතික ප්‍රගතිය සියයට 62ක් විය.

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවිධානයේ නව කාර්යාල සහ විද්‍යාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ගිවිසුම ප්‍රකාරව දින 240 කින් නිම කළ යුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දින වන විට දින 1,746 ක කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | සංවිධානයේ පාලනයෙන් පරිබාහිරව සිදුවූ විවිධ හේතු මත ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද විය. 2023 මැයි 31 වන විට එය විවෘත කිරීමට අවශ්‍ය සියළු කටයුතු සිදුකර ඇත. | සැලසුම් කල පරිදි ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට පියවර ගත යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවිධානයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් සඳහා පුරප්පාඩු 35 ක් පැවතුණි. මේ අතර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ අධ්‍යක්ෂ (නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ) තනතුර 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. තවද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03ක් වන ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, විද්‍යාඥ, කළමනාකරු (තාක්ෂණික / රසායනාගාර) යන තනතුරුවලද පුරප්පාඩු සංඛ්‍යාව 33 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ සහ කළමනාකරු තනතුරු වර්ෂ 04 ක කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | අධ්‍යක්ෂ (ආයතනික) තනතුර දැරූ නිලධාරියා 2016 අගෝස්තු මාසයේදී ඉල්ලා අස්වීමෙන් පසුව 2018.01.02 දින දක්වා මානව ජනාවාස සැළසුම් හා පුහුණු කිරීමේ අංශයේ අධ්‍යක්ෂ වැඩ බැලීම සඳහා පත්කර අනතුරුව මෙම තනතුර සඳහා පාලන හා මුදල් ලෙස තනතුරු දෙකක් අනුමත වීමෙන් පසුව එම තනතුරු සඳහා නිලධාරීන් දෙදෙනෙකු 2018 ජනවාරි 02 දින සිට පත්කරන ලදී. අනතුරුව අධ්‍යක්ෂ (පාලන) වශයෙන් පත්කල අය 2018 අගෝස්තු මාසයේදී සේවයෙන් ඉවත්වීමෙන් අනතුරුව අවස්ථා 04 කදී අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා අයදුම්පත් කැඳවූවද සුදුසු අයෙකු නොවීම හේතුවෙන් පුරප්පාඩුව පිරවීමට නොහැකි වීය. මෙම තනතුරේ රාජකාරි ආවරණය සඳහා සහකාර අධ්‍යක්ෂ (පාලන) වෙත රාජකාරී පවරා අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා සුදුසු අයෙකු පත්කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනිමට ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.<br><br>අනුමත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් අධ්‍යක්ෂ තනතුරුවන අධ්‍යක්ෂ (LRRMD), තනතුර දැරූ අධ්‍යක්ෂවරයා 2018 වර්ෂයේදී නායයෑම් අවදානම අවම කිරිමේ | පුරප්පාඩු පැවතීම ආයතනයේ කාර්ය සාධනයට අහිතකර ලෙස බලපායි නම් පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොවේ නම් කාර්ය මණ්ඩල සංයුතිය සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |

ව්‍යාපෘති අධ්‍යක්ෂ වශයෙන් නිදහස් කිරීම නිසා එම තනතුරේ වැඩ බැලීමට ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයෙක් පත්කර තිබුණි. අනතුරුව 2022.12.31 එම අධ්‍යක්ෂවරයා විශ්‍රාම යාමෙන් පසුව මේ වන විටත් මෙම තනතුර පුරප්පාඩු වී ඇත. මානව ජනාවාස සැලස්ම් හා පුහුණු කිරීමේ අංශයේ (HSTPD) අධ්‍යක්ෂවරයාද 2022.12.31 විශ්‍රාම යාමෙන් පසුව එම තනතුරේ වැඩ බැලීමට ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයෙක් පත්කර ඇත.

මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් 2019 වසරේ සිට සියළු බඳවා ගැනීම් අත්හිටුවීමට ලබාදී තිබූ නියෝග හේතුවෙන් බඳවා ගැනීම් හා පුරප්පාඩු පිරවීමට අවස්ථාව නොතිබූ අතර මේ වන විට මෙම සියළු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අන්තර් කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශ මත රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචනය සඳහා පත්කර ඇති කමිටුව වෙත යොමුකර ඇත. ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලද පසු අත්‍යවශ්‍ය තනතුරු පිරවීමට කටයුතු කරනු ලැබේ. ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා නව බඳවා ගැනීම සිදුනොකිරීමට හා පුරප්පාඩු සඳහා කාර්ය සාධන බලකාය මඟින් ලබා ගැනීමට උපදෙස් ලබාදී ඇත. රටේ වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය සමඟ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල පසුබෑම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයටද බලපා ඇති බැවින් නව බඳවා ගැනීම් සිදු නොකර පවතින කාර්ය මණ්ඩලයෙන් කළමනාකරණය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. නොඑසේ නම් එය ආයතනයේ මූල්‍ය කළමනාකරණයට බලපානු ලැබේ.